**පුබුදින පස් පියුම් වැඩසටහන**

කලාප අධ්‍යාපන කාර්යාලය - මහනුවර

සිසු නිපුණතා සාධන අනාවරණය

5 ශ්‍රේණිය - මව්බස

නම .............................................. පාසල ..............................................

1)පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

අපි මේ වන විට පැය දොළහක් වැඩ කර පැය දොළහක් විවේක ගත්තා. සදාකාලික හිරු එළියේ පාවෙන අපට රැයක් දවාලක් නොතිබුණත් යම් කිසි කාලසටහනකට වැඩ කිරීම පහසු වුණා. එදා උදේ හයට මා අවදි වූයේ තරමක හිසේ ඇම්මක් ඇතුවයි. රෑ තිස්සේ විකාර සිහින කිහිපයක් දුටු බවත් මට මතක තිබුණා. මා උදේ ආහාරයට යෑමට සූදානම් වූයේ දැඩි ලෙස අලස ගතියකින් කෑම මේසයේ වැඩි කතාබහක් සිදු වූයේ නැහැ. එක පුටුවක් හිස්ව තිබුණා.

1. ඡේදයේ කියවෙන පරිදි මේ අයට රැයක් දවාලක් නොතිබුණේ ඇයි?

   ..............................................................................................................................

2. මේ අය දවසේ පැය 24 වැඩ කටයුතු සඳහා බෙදා වෙන්කර ගෙන තිබුණේ කෙසේද?

   ..............................................................................................................................

3. මෙහි සඳහන් පුද්ගලයාට උදෑසන ශරීරයට දැනුන අපහසුතාවය කුමක්ද?

   ..............................................................................................................................

4. එම අපහසුතාවය ඇති වූයේ කුමන හේතුවත් නිසාද?

   ..............................................................................................................................

5. යම්කිසි අසනීපයක් ගැන ඡේදයේ සඳහන් වේ. එය කුමක්ද?

   ..............................................................................................................................

6. මේවායේ අර්ථය පැහැදිලි කරන්න.

    i. රෑ තිස්සේ ……………………………………………..

    ii. අලස ගතියකින් ……………………………………………..

    iii. සදාකාලික ……………………………………………..

7. පහත වචන වලට විරුද්ධ පද ඡේදයෙන් සොයා ලියන්න.

    i. සඳු ……………………………………………..

    ii. තාවකාලික ……………………………………………..

    iii. කඩිසර ……………………………………………..

8. ඡේදයේ සඳහන් උත්තම පුරුෂ බහු වචන පදය කුමක්ද? …………………………………..

9. උදේ හයට මම අවදි වූවා. මෙම වාක්‍යය ලිඛිත බසට හරවා ලියන්න.

………………………………………………………………………………………………………...

10. මූර්ධජ අක්ෂර යෙදී ඇති වචන 2ක් ඡේදයෙන් සොයා ලියන්න.

…………………………………… ……………………………………...

11. ඉරි ඇඳි පිල්ලමේ නම ලියන්න.

    i. <u>රැ</u>යක් ……………………………………………..

    ii. හි<u>රු</u> ……………………………………………..

    iii. ඇ<u>ම්</u>මක් ……………………………………………..

(ල.20)

2)නිවැරදි අකුර යොදා හිස්තැන් පුරවන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ආරක් ...... ක (ශ , ෂ) | 2. | කනිෂ් ...... (ට , ඨ) |
| 3. | ප්‍රමු ...... (ඛ , ක) | 4. | ...... ලමය (ශයි , ශෛ) |
| 5. | සෞ ...... (ක්‍ය , ඛ්‍ය) | 6. | ස ...... ද්ධි (මු , මෘ ) |
| 7. | පෘ ...... විය (තු , ථි ) | 8. | සං ...... වක් (කදා , ඥා) |
| 9. | පරිප ...... ය (ථ , ත) | 10. | පරි ...... ණකය (ඝ , ග) |

(ල.10)

3)පහත වචන වලට සමාන පද ලියන්න.

1. තරු - ................................
2. දූපත - ................................
3. ඔළුව - ................................
4. ප්‍රවෘත්තිය - ................................
5. පාර - ................................ (ල.10)

4)පහත සඳහන් වචන වලට විරුද්ධ පද ලියන්න.

1. ඉදිරිපස - ................................
2. පිපෙනවා - ................................
3. ප්‍රශ්න - ................................
4. පුරුදු - ................................
5. සෙමෙන් - ................................ (ල.10)

5)යුගල පද සම්පූර්ණ කරන්න.

1. ගමන් - ................................
2. අහල - ................................
3. ගෙවල් - ................................
4. කෙළි - ................................
5. තෑගි - ................................ (ල.05)

6)පහත ප්‍රස්තාව පිරුළු වල හිස්තැනට යෙදෙන වචනය හිස්තැන මත ලියන්න.

1. ළිඳේ ඉන්න ................................ වගේ.
2. කළුවා ................................ . ගියා වගේ. (ල.02)

7)පහත කෙටි යෙදුම් විස්තර කර ලියන්න.

1. ලං.ග.ම - ................................
2. ස.තො.ස - ................................
3. ගු.භ - ................................ (ල.03)

8)පහත වාක්‍ය වලට ගැළපෙන විරාම ලකුණු යොදන්න.

4. සීයා ගමට ගියාද
5. කොරෝනා වසංගතය හේතුවෙන් සියලු පාසල් විශ්ව විද්‍යාල වසා දමා ඇත
6. අනේ මා බේරා ගන්න (ල.04)

9)පහත දැක්වෙන වාක්‍ය වලට ගැළපෙන අතීත කාල ආඛ්‍යාත පද ලියන්න.

1. තාත්තා උදෑසන ම කාර්යාලයට ................................
2. ඈ අසරණ දරුවන්ට උදවු ................................
3. අපි එළවළු කොටුවට වතුර ................................
4. සුළඟින් ගස් ඒ මේ අත ................................
5. ගොවියෝ උදෑසනින්ම කුඹුරට ................................
6. වෛද්‍යවරු මහත් වෙහෙසක් ගෙන රෝගීන් සුවපත් ................................
7. නංගී දක්ෂ ලෙස ගීතය ගායනා ................................
8. මම පාසලේ ගෙදර වැඩ සියල්ල නිමි ................................
9. අයියා හොඳින් අධ්‍යාපනය ................................
10. තරුව රෑ අහසේ ................................ (ල.20)

10) පද ගළපා වාක්‍ය නැවත ලියන්න.

1. මේ මහපටැඟිල්ලේ / බැලුවා / බින්දු / ගැන / සිනා අරුමය.

.........................................................................................................................

2. පරම / මිනිසාට / යුතුකම / මිනිසාගේ / කිරීමයි. / සේවය

.........................................................................................................................

3. පුදුමයට / අප / කවුරුත් / පණ / ඈට / ආවා / පත් / කරමින්

.........................................................................................................................

(ල.06)

11) ලොවම බියට පත් කරමින් දහස් ගණන් ජීවිත බිලිගත් කොරෝනා වසංගතය අප සැමට අලුත් පාඩමක් කියා දුන් බව පෙනේ. වසංගත රෝග පැතිරීම පාලනය කර ගත හැක්කේ ද මිනිසාටමය. ඉහත කරුණු ගැන සිතා "වසංගත රෝග වලින් වැළකීමට අපට කළ හැකි දේ" යන මාතෘකාවට වචන 5 කට වැඩි වාක්‍ය 5ක් ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

4. ..............................................................................................................................

5. ..............................................................................................................................

(ල.10)